වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சு
State Ministry of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல: / My No. SMRIP/ES/01/06/අභ්‍යන්තර චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல: / Your No. | දිනය / திகதி / Date 2021.02.23 |

දිස්ත්‍රික් ලේකම් මගින්,
දිස්ත්‍රික් විද්‍යා නිලධාරී.

අමාත්‍යාංශ චක්‍රලේඛ : 02/2021

## දිස්ත්‍රික් විද්‍යා සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

"විද්‍යා සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම" යන මැයෙන් නිකුත් කර ඇති 2021.01.11 දිනැති අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2021 සහ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2012.09.24 දිනැති අංක විද්‍යා ස.ම. 2012/01 චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. ඒ අනුව, දිස්ත්‍රික් විද්‍යා සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අදාලව අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2021 හි 3 සහ 3.1 වගන්තිත් පහත පරිදි ඇතුලත් කරනු ලැබේ.

**3. යටිතල පහසුකම්**

- විදුලිය :- පරිභෝජනය කරන විදුලි ඒකක ප්‍රමාණය අනුව මසකට රු.1000.00 ක උපරිමයකට යටත්ව විදුලි බිල්පත් සඳහා ගෙවීම් කළ හැක.
- ජලය :- පරිභෝජනය කරන ජල ඒකක ප්‍රමාණය අනුව ගණන් බලා ජල වියදම් සීමාව නියම කෙරේ. මසකට උපරිමය රු. 500.00 කි.
- දුරකථන :- මසකට උපරිමය රු. 3500.00 කි. (විද්‍යුත් තැපැල හා අන්තර්ජාල වියදම් ඇතුළුව) (නව දුරකථන සම්බන්ධතා සඳහා මිල ගණන් කැඳවා ඇති බැවින්, මෙම මුදල සංශෝධනය විය හැක.)

**3.2 ගමන් වියදම්** - දිස්ත්‍රික් විද්‍යා නිලධාරින්ට මසකට උපරිමය රු. 6,000.00 කි.

එසේ ගෙවනු ලබන්නේ නියමිත පරිදි මුදල් අනුමත කරවා ගත් වැඩසටහන් හා ඉටු කරන ලද කාර්යයන් සලකා බැලීමෙනි. මෙම උපරිම සීමාවන් වාර්ෂික ප්‍රතිපාදන තත්වයන් මත වරින් වර සලකා බැලීම යටත් වේ.

03. ඉහත චක්‍රලේඛනවල සඳහන් අනෙකුත් කරුණු, එලෙසම බලපැවැත්වෙනු ඇත.

එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක,
ලේකම්,
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු, සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

පිටපත් :-

1. අතිරේක ලේකම් (පාලන) - කරු. දැ.ගැ.ස.
2. අතිරේක ලේකම් (සංවර්ධන, සැලසුම් හා විද්‍යා) - කරු. දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ (විද්‍යා) - කරු. දැ.ගැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරී - කරු. අ.ක.ස.
5. ES/07 විෂය භාර නිලධාරී - කරු. අ.ක.ස.